# සිංහලදීප ජාතික පෙරමුණ

- ව්‍යවස්ථාව -

01.00 පක්ෂයේ නම : -
සිංහලදීප ජාතික පෙරමුණ යනු මෙම දේශපාලන පක්ෂයේ නම වන්නේය.
එම නාමයේ ඉංග්‍රීසි පරිවර්තනය "Sinhaladeepa National Front" (SNF) ලෙස සඳහන් විය යුත්තේය.
මෙම ව්‍යවස්ථාවේ පක්ෂය යනුවෙන් හඳුන්වනු ලබන්නේ සිංහලදීප ජාතික පෙරමුණම වන්නේය. සිංහලදීපය යනුවෙන් හඳුන්වනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගනු ලැබ ඇති ශ්‍රී ලංකා රාජ්‍යයට අයත් භූමි ප්‍රදේශයයි.

02.00 පක්ෂයේ ආරම්භය : -
සම්මත වර්ෂ 1999 අප්‍රේල් මස 22 වෙනිදාය.

03.00 පක්ෂයේ ලාංඡනය : -
පළමුවෙනි උපලේඛණයේ දැක්වෙන කඩුව ලාංඡනය පක්ෂයේ මැතිවරණ ලාංඡනය වන්නේය.

04.00 පක්ෂයේ වර්ණය : -
රත්රන් පාට පක්ෂයේ වර්ණය වන්නේය.

05.00 පක්ෂයේ අරමුණ : -
පණ්ඩුකාභය රජතුමා විසින් සිවු හෙලයන් එක්සේසත් කොට සම්මත වර්ෂ යට 437 දි බිහි කරන ලද සිංහල ජාතික රාජ්‍යයේ පාලනය වර්ෂ 1815 දි සිංහල ජාතියට අහිමිවීමෙන් පසු භූමියේ හා ජාතිකත්ව නිල අයිතිය වර්ෂ 1948 දි යලි නොලැබුන හෙයින් එම අයිතීන් යලි ලබා ගැනීමට සිංහල ජාතික දේශපාලනයක් තුලින් මැතිවරණ ජයග්‍රහණය කොට පක්ෂය සිංහලදීපය තුළ ආණ්ඩුවක් පිහිටුවා සිංහලදීප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පනවා සිංහල ජාතික රාජ්‍යය යලි ස්ථාපිත කිරීම පක්ෂයේ දේශපාලන අරමුණ වන්නේය.

06.00 පක්ෂයේ සාමාජිකත්වය

06.01 පක්ෂයේ දේශපාලන මතවාදය, ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාව පිළිගන්නා වයස 18 සම්පූර්ණ කළ ශ්‍රී ලංකා රාජ්‍යයේ පුරවැසියෙකු වන ඕනෑම පුද්ගලයෙකුට පක්ෂයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැකිය. පක්ෂය විසින් නිකුත් කරනු ලබන සාමාජික ඉල්ලුම්පතක් පුරවා, සාමාජික මුදල ගෙවූ පසු පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ තීරණය මත එම ඉල්ලුම්කරුට/කාරියට පක්ෂයේ සාමාජිකත්වය පිරිනමන්නේය. සාමාජික ඉල්ලුම්පතක්, සාමාජික මුදල සමග පක්ෂයේ මහ ලේකම් වෙත හෝ මහ ලේකම් විසින් බලය පවරන ලද පක්ෂ නියෝජිතයෙකු වෙත ඉදිරිපත් කළ යුතුය. වාර්ෂික සාමාජික මුදල රු. 100/- කි. වාර්ෂික සාමාජිකත්වය සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 වෙනිදා අවසාන වන්නේය. සාමාජිකත්වය අළුත් කිරීම වර්ෂය අගදී කළ හැකිය. මාස 03 ක් ඉකුත්වූ පසු අළුත් කිරීම සඳහා කෙරෙන ඉල්ලීම් මධ්‍යම කාරක සභාවේ අභිමතයට යටත් වන්නේය. සාමාජිකත්වය ලබන සෑම පුද්ගලයෙකුම තමා හෝ තමාගේ අධීක්ෂණය යටතේ පුරවනු ලද සාමාජික ඉල්ලුම් පත්‍රයේ අඩංගු කරුණුවල යම් වෙනසක් සිදුවුවහොත් ඒ පිළිබඳව මාස තුනක් ඇතුලතදී පක්ෂයේ මහ ලේකම්ට ලිඛිතව දැනුම් දිය යුතුය.

06.02 පක්ෂය විසින් පිරිනමන ලද සාමාන්‍ය සාමාජිකත්වයක් වර්ෂ දෙකක පරිවාස කාලයකට යටත් වන අතර ක්‍රියාකාරී සාමාජිකත්වයක් වර්ෂ තුනක පරිවාස කාලයකට යටත් වන්නේය. යම් සාමාජික ඉල්ලුම්පතකට, සාමාජිකත්වය පිරිනැමීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුය. මෙම බලය සාමාන්‍යයෙන් මහ ලේකම් විසින් ක්‍රියාත්මක කරන්නේය. යම් ඉල්ලුම්පතක් ප්‍රතික්ෂේප කිරීමට හේතු දැක්වීමට මධ්‍යම කාරක සභාව බැඳී නොසිටී.

06.03 සාමාජිකත්වය ඉල්ලුම් කරන සෑම පුද්ගලයෙකුම පක්ෂයේ දේශපාලන මතවාදය, ප්‍රතිපත්ති හා පක්ෂ ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිබඳව සාමාන්‍ය අවබෝධයක් ඇති බවට පක්ෂය සලකන අතර, වෙනත් පිළිගත් /නොපිළිගත් දේශපාලන පක්ෂයක /පක්ෂවල සාමාජිකත්වය ඔහු/ඇය ඒ වනවිට දරන්නේ නම් එම සාමාජිකත්වයන්ගෙන් ඉවත්වූවෙකු ලෙස පක්ෂය සලකනු ලැබේ. පක්ෂ සාමාජිකත්වය ලබාගත් සාමාජිකයෙකු මධ්‍යම කාරක සභාවේ පූර්ව ලිඛිත අවසරය නොලබා වෙනත් පක්ෂයක සාමාජිකත්වය ලබාගතහොත්, මෙම පක්ෂයේ සාමාජිකත්වය ඒ සමගම අහෝසි වන්නේය.

06.04 පක්ෂයේ කිසිම සාමාජිකයෙකු මහ ලේකම්ගේ පූර්ව ලිඛිත අවසරය නොලබා පක්ෂය වෙනුවෙන් කිසිම නිල ප්‍රකාශයක් හෝ ප්‍රකාශණයක් වාචිකව හෝ ලිඛිතව, විද්‍යුත් හෝ මුද්‍රිත හෝ වෙනත් සංනිවේදන මාධ්‍යයක් මගින් හෝ නිකුත් නොකළ යුතු අතර පක්ෂය වෙනුවෙන් ගිවිසුම්වලට වාචිකව හෝ ලිඛිතව එළඹීම හෝ ලේඛණවලට අත්සන් තැබීම ද නොකළ යුතුය. පක්ෂයේ මතවාදය, ප්‍රතිපත්ති හා අරමුණුවලට පටහැනි යම් දේශපාලන කටයුත්තක ද නිරත නොවිය යුතුය. පක්ෂය හෝ පක්ෂයේ සාමාජිකයන් අපකීර්තියට ද පත් නොකළ යුතුය.

06.05 සාමාජිකයෙකුගේ ඉල්ලා අස්වීම, අභාවප්‍රාප්තවීම, අතුරුදහන්වීම, පක්ෂය අතහැර යාම හෝ ඉහත අංක 06.02, 06.04 හි සඳහන් කරුණු මත එම සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය මධ්‍යම කාරක සභාවට අහෝසි කළ හැකිය.

06.06 පක්ෂයේ ආරම්භයේ සිට මධ්‍යම කාරක සභිකයන් ලෙස කටයුතු කළ සියළු දෙනා පක්ෂයේ පුරෝගාමීන්ය. වසර දහයකට (10) වැඩි කාලයක් අඛණ්ඩව මධ්‍යම කාරක සභිකයන් ලෙස කටයුතු කළ පුද්ගලයන් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන්වේ. පක්ෂයේ පැවැත්ම හෝ ආරක්ෂාව සම්බන්ධව අවසාන තීරණ ගැනීමේ බලය හා වගකීම, පළමුව පුරෝගාමීන් ද, ඉන්පසුව ජ්‍යෙෂ්ඨයන් ද සතුය. එම බලය සහ වගකීම අවස්ථාවෝචිත පරිදි තනිතනිවත්, සාමූහිකවත් පුරෝගාමීන් හා ජ්‍යෙෂ්ඨයන් විසින් ක්‍රියාත්මක කළ යුත්තේය. පක්ෂයේ අවසරය ඇතිව මධ්‍යම කාරක සභාවෙන් තාවකාලිකව ඉවත්වූ සභිකයෙකුගේ පුරෝගාමීත්වයේ හෝ ජ්‍යෙෂ්ඨත්වයේ කිසිදු වෙනසක් සිදු නොවේ. පක්ෂයෙන් හෝ මධ්‍යම කාරක සභාවෙන් ඉවත්වූ හෝ ඉවත් කළ හෝ පක්ෂය අතහැර ගිය හෝ පුද්ගලයන්ට එම අයිතිය හිමි නොවේ.



ජයන්ත ලියනගේ
මහ ලේකම්
සිංහලදීප ජාතික පෙරමුණ
සම්බන්ධීකරණ කාර්යාලය
14/5A, ධර්මපාල මාවත, පොල්අත්තාපිටිය.

07.00 <u>පක්ෂ සාමාජිකයකු මැතිවරණවලදී කටයුතු කළ යුතු ආකාරය</u>

07.01 පක්ෂ සාමාජිකයෙකු යම් මැතිවරණයකදී හෝ ඡන්ද විමසීමකදී පක්ෂයේ අපේක්ෂකයෙකුට හෝ මධ්‍යම කාරක සභාව විසින් සහාය දිය යුතු යයි තීරණය කරන ලද වෙනත් පක්ෂයක හෝ සංධානයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයෙකුට හැර අන් පක්ෂයක හෝ සංධානයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයෙකුට කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් සහය දීම පක්ෂයට ද්‍රෝහිවීමක්, එරෙහිවීමක් හා පක්ෂය පාවාදීමක් වන්නේය.

07.02 පක්ෂයේ මන්ත්‍රීවරයෙකු පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව පළාත් පාලන ආයතනයක, පළාත් සභාවක හෝ පාර්ලිමේන්තුවේදී වෙනත් දේශපාලන පක්ෂයකට, දේශපාලන කණ්ඩායමකට, සංධානයකට හෝ ස්වාධීන කණ්ඩායමකට හෝ පුද්ගලයෙකුට සහය දැක්වීම, පක්ෂව අසුන් ගැනීම, ඡන්දය භාවිතා කිරීම, පක්ෂයෙන් ඉවත්ව ස්වාධීනව කටයුතු කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් සමග එක්ව කටයුතු කිරීම පක්ෂයට ද්‍රෝහිවීමක්, එරෙහිවීමක්, පක්ෂය පාවාදීමක් යන විනය විරෝධී ක්‍රියාකාරම් වන්නේය.

07.03 යම් මැතිවරණයකදී හෝ ඡන්ද විමසීමකදී යම් සාමාජිකයෙකු වෙනත් පක්ෂයක අපේක්ෂකයෙකු ලෙස තරග කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා මධ්‍යම කාරක සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

08.00 <u>විනය පාලනය</u>

08.01 මහ ලේකම් විසින් පත් කරනු ලබන මධ්‍යම කාරක සභිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විනය කමිටුවක් වන්නේය.

08.02 පක්ෂ ව්‍යවස්ථාවේ අඩංගු විධිවිධාන කඩකිරීමක්, පක්ෂයට ද්‍රෝහිවීමක්, එරෙහිවීමක්, පක්ෂය පවාදීමක් හෝ සාමාජිකයෙකු අපකීර්තියට ලක් කිරීමක් යන ආකාරයේ කරුණක් සම්බන්ධව යම් සාමාජිකයෙකුට විරුද්ධව පැහැදිලි ලිඛිත පැමිණිල්ලක් හෝ දැන ගැනීමක් විනය කමිටුවට ලැබුණ විට ඔහුගේ / ඇයගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවා, එම සාමාජිකයා සම්බන්ධව විනය පරීක්ෂණයක් පැවැත්වීමට විනය කමිටුවට බලය ඇත්තේය. එම විනය කඩ කිරීම සම්බන්ධව පැවැත්වෙන විනය පරීක්ෂණයකින් පසුව පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපීම ඇතුළු සුදුසු පියවරක් ගැනීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය.

08.03 විනය කමිටුව විසින් අභ්‍යයන්තර විමර්ෂණයකින් පසුව එලෙස විනය කඩකරන ලද සාමාජිකයාට එම චෝදනාවට එරෙහිව නිදහසට කරුණු ඉදිරිපත් කිරීම, සාක්ෂි කැඳවීම සඳහා විනය පරීක්ෂණයට සහභාගි වන මෙන් දින නියම කොට ලිපියක්, ලියාපදිංචි හෝ විද්‍යුත් තැපෑලෙන් යැවිය යුතුය. එලෙස නියම කරන ලද දිනය, ලිපිය තැපැල් කරන ලද හෝ විද්‍යුත් තැපෑල යැවූ දිනයේ සිට දින දහයක කාලයක් ඉකුත් වූ දිනයක් විය යුත්තේය.

08.04 පක්ෂයේ යම් ආසන බල මණ්ඩලයක හෝ අනුබද්ධ සංවිධානයක සාමූහික විනය කඩකිරීමක් සම්බන්ධව ඉහත සඳහන් ක්‍රියාපටිපාටියට සමාන ක්‍රියාපටිපාටියක් මධ්‍යම කාරක සභාවට අනුගමනය කළ හැකි අතර, එම ආසන බල මණ්ඩලය හෝ අනුබද්ධ සංවිධානය ප්‍රතිසංවිධානය කිරීමේ හෝ විසුරුවා හැරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුය.

09.00 <u>මධ්‍යම කාරක සභාවේ ව්‍යුහය හා ක්‍රියාපටිපාටිය</u>

09.01 ප්‍රථම මධ්‍යම කාරක සභාවේ නිලධාරීන් ඇතුළු කාරක සභිකයන් එම තනතුරු පලමු ජාතික සම්මේලනය තෙක් දරන්නේය. ඔවුන් නැවත පත්වීමට සුදුස්සෝ වන්නෝය. මධ්‍යම කාරක සභාවට සභිකයන් පත් කිරීම, මධ්‍යම කාරක සභිකයෙකුගේ යෝජනාව මත බහුතර ඡන්දයෙන් සිදු කල යුත්තේය. මධ්‍යම කාරක සභිකයෙකු, මධ්‍යම කාරක සභාවෙන් ඉවත් කිරීම පුරෝගාමීන්ගේ හා ජ්‍යෙෂ්ඨයන්ගේ ඡන්දය ඇතුළු 2/3 ක ඡන්දයෙන් කල යුතුය.

09.02 සභාපති (1), මහ ලේකම් (1), භාණ්ඩාගාරික (1) උප සභාපති (2), නියෝජ්‍ය ලේකම් (2), පාලන ලේකම් (1), ප්‍රචාරක ලේකම් (1), මාධ්‍ය ප්‍රකාශක (1), ජාතික සංවිධායක (1) නියෝජ්‍ය ජාතික ජාතික සංවිධායක (1) යන නිලධාරීහු පක්ෂයේ නිලධාරී මණ්ඩලයවේ. කාරක සභිකයන් තිදෙනෙකි. මධ්‍යම කාරක සභිකයන් අතුරින් කෙනෙකු පක්ෂ නායකයා ලෙස පත් කර ගත හැකි අතර සාමාන්‍යයෙන් සභාපති පක්ෂ නායක ලෙස කටයුතු කරන්නේය.

09.03 මධ්‍යම කාරක සභාවේ නිලධරයන්ගේ යම් පුරප්පාඩුවක් සිදුවුවහොත් එම නිලයට තාවකාලිකව මධ්‍යම කාරක සභිකයෙකු හෝ වෙනත් සාමාජිකයෙකු පත් කර ගැනීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය. සභාපති, මහ ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරුවල පුරප්පාඩු හැකි ඉක්මණින් පිරවිය යුතුය. අනෙකුත් තනතුරුවල පුරප්පාඩුව පැවතිය හැක. එක් සභිකයෙකුට දැරිය හැකි උපරිම තනතුරු ගණන දෙකකි. එසේ වුව ද, සභාපති, මහ ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු අතුරින් දෙකක් එකවර, එක් සභිකයෙකුට දැරිය නොහැකිය.

09.04 මධ්‍යම කාරක සභා රැස්වීම්වල මුලාසනය සාමාන්‍යයෙන් සභාපති විසින් දරන්නේය. සභාපති නොමැති විටකදී යම් රැස්වීම් වාරයක් සඳහා සාමූහිකව තෝරා ගන්නා ලද සභිකයෙකුට ද මුලසුන දැරිය හැක්කේය. මධ්‍යම කාරක සභා රැස්වීමක තීරණ බහුතර ඡන්දයෙන්, අත එසවීමෙන් ගත යුත්තේය. එක් සභිකයෙකුට එක් ඡන්දයක් හිමිය. යම් ඡන්ද විමසීමකදී පක්ෂව හා විපක්ෂව දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව සමාන වූ විටෙක පමණක් මුලාසනය දරන සභිකයා අමතර ඡන්දයක් පාවිච්චි කළ යුතුය. මධ්‍යම කාරක සභා රැස්වීමක ගණපූර්ණය පත් කොට ඇති සභික සංඛ්‍යවෙන් අඩකට වඩා වැඩි විය යුත්තේය. මධ්‍යම කාරක සභාවට අවශ්‍ය වුවහොත් රහස් ඡන්දයක් පැවැත්විය හැක්කේය. මධ්‍යම කාරක සභා රැස්වීම් වාරයක් අවසානයේදී හෝ මහ ලේකම් විසින් පසුව තීරණය කරන දිනයක දී මධ්‍යම කාරක සභාවට රැස්විය හැක්කේය. හදිසි රැස්වීමක් කැඳවීමට මහ ලේකම්ට බලය ඇත්තේය. හදිසි රැස්වීමක් කැඳවීමට කාල වේලාවක් නොමැති විටක දී මධ්‍යම කාරක සභාව වෙනුවෙන් තීරණ ගැනීමේ බලය මහ ලේකම් සතුය. එවැනි තීරණ ඊළඟ රැස්වීමේ දී අනුමත කරවා ගත යුත්තේය.

09.05 මධ්‍යම කාරක සභිකයෙකු, මධ්‍යම කාරක සභාවේ මතය අනුව සාධාරණ හේතුවක් නොමැතිව රැස්වීම් වාර තුනකට පිට පිට සහභාගි නොවුනහොත් එම සභිකයා මධ්‍යම කාරක සභාවෙන් ඉවත් වූවෙකු ලෙස සැලකීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය. මධ්‍යම කාරක සභිකයෙකුට පිළිගත් සන්නිවේදන උපකරණ මගින් මධ්‍යම කාරක සභා රැස්වීම්වලට සහභාගි විය හැකි අතර පැමිණීමේ ලේඛණයේ අත්සන් තැබීම පසුව තමාටම හෝ තමා විසින් බලය පවරන ලද වෙනත් මධ්‍යම කාරක සභිකයෙකුට හෝ කළ හැක්කේය.

10.00 <u>මධ්‍යම කාරක සභාවේ බලතල</u>

10.01 පක්ෂයේ මතවාදය, දර්ශණය හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

10.02 පක්ෂ ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම, අර්ථනිරූපනය කිරීම සහ ඒ සඳහා රීති පැනවීම.

10.03 පක්ෂයට සාමාජිකයන් බඳවා ගැනීම, සාමාජිකත්වය අළුත් කිරීම, සාමාජිකත්වය අත්හිටුවීම, සාමාජිකත්වයෙන් නෙරපීම, පක්ෂ සමාජිකයන්ගේ විනය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම. දිස්ත්‍රික් ප්‍රධාන හා නියෝජ්‍ය සංවිධායකවරුන්, ආසන සංවිධායකවරුන් පත් කිරීම හා ඉවත් කිරීම. මෙම බලය සාමාන්‍යයෙන් මහ ලේකම් විසින් ක්‍රියාත්මක කරන්නේය.

10.04 මැතිවරණ ප්‍රකාශණ හා අනෙකුත් නිල ප්‍රකාශණ නිකුත් කිරීම, ප්‍රසිද්ධ රැස්වීම් සහ මාධ්‍ය රැස්වීම් කැඳවීම.

10.05 සමස්ත දිස්ත්‍රික් කාරක සභාව, දිස්ත්‍රික් කමිටු හා ආසන බලමණ්ඩල පිහිටුවීම හා ගම්කමිටු පිහිටුවීම, ඒවායේ කටයුතු අධීක්ෂණය කිරීම, නියෝග නිකුත් කිරීම, වාර්තා ලබා ගැනීම, ප්‍රතිසංවිධානය කිරීම හෝ විසුරුවා හැරීම.

10.06 පක්ෂය විසින් තරඟ කල යුතු මැතිවරණ තීරණය කිරීම, ඡන්ද අපේක්ෂකයන් නම් කිරීම, ජාතික ලැයිස්තුව සකස් කිරීම, මැතිවරණ හෝ වෙනත් නියෝජිතයන් පත් කිරීම. ජනාධිපතිවරණයකදී අපේක්ෂකයෙකු නම් කිරීම.

10.07 පක්ෂයේ කටයුතු ඉෂ්ට කිරීමට අවශ්‍ය කාරක සභා පත් කිරීම හා අරමුණු සාක්ෂාත් කිරීම පිණිස අවශ්‍ය දෑ කිරීම.

10.08 ජාතික සම්මේලනය හා විශේෂ සම්මේලන කැඳවීම හා මෙහෙයවීම.

10.09 පක්ෂයට බැංකු ගිණුමක් හෝ ගිණුම්, අරමුදලක්, මුලස්ථානයක්, සම්බන්ධීකරණ කාර්යාලයක්, දිස්ත්‍රික්, ආසන කාර්යාල හා කාර්ය මණ්ඩල පවත්වාගෙන යාම.

10.10 පක්ෂයේ නාමය, ලාංඡනය, මධ්‍යම කාරක සභාවේ තනතුරු සංඛ්‍යාව / ස්වභාවය වෙනස් කිරීම.

10.11 පක්ෂයේ ප්‍රගතිය පිණිස අවශ්‍ය වූ විටෙක අනෙකුත් පක්ෂ / සංවිධාන / ආයතන / පුද්ගලයන් සමග ගිවිසුම්වලට එළඹීම සහ අනෙකුත් පක්ෂ සමග සංධානගතවීම, අවශ්‍ය පරිදි දේශීයව හෝ විදේශීයව වෙනත් සංවිධාන හා අනුබද්ධ සංවිධාන පිහිටුවීම.

10.12 මෙම ව්‍යවස්ථාවේ සඳහන් වගන්තියක් හෝ කාරණයක් මුල් කොට ගෙන අවශ්‍ය ක්‍රියාපටිපාටීන් සකස් කිරීම.

10.13 ගම්කමිටුවල, ආසන බලමණ්ඩලවල, දිස්ත්‍රික් කමිටුවල, උපදේශක සභාවේ, අනුශාසක සභාවේ සහ අනුබද්ධ සංවිධානවල රීතිමාලාව සකස් කිරීම.

10.14 මෙම ව්‍යවස්ථාවේ අඩංගු විධිවිධාන වලින් ආවරණය නොවන හෝ විධිවිධානවල පරස්පරයන් ඇති අවස්ථාවන් හි දි, ඒ පිළිබඳව තීරණ ගැනීම. පක්ෂයේ පැවැත්ම, ප්‍රගතිය පිණිස අවශ්‍ය වූ විටෙක වෙනත් දෑ කිරීම.

10.15 මධ්‍යම කාරක සභාව විසින් ගන්නා තීරණ අවසාන හා තීරණාත්මක වන්නේය.

11.00 <u>ගම්කමිටු</u>
සෑම ගමකටම පක්ෂයේ ගම්කමිටුවක් පිහිටු විය හැක්කේය. සෑම ගම්කමිටුවක්ම මධ්‍යම කාරක සභාව විසින් සකස් කර දෙනු ලබන රීතිමාලාවක් භාවිතා කළ යුතුය.

12.00 <u>ආසන බලමණ්ඩල</u>
සෑම මැතිවරණ කොට්ඨාශයකටම පක්ෂයේ ආසන බලමණ්ඩලයක් පිහිටු විය හැක්කේය. යම් ආසනයක පිහිටුවන ලබන ගම්කමිටුවල නිලධාරීන් එම ආසන බලමණ්ඩලයේ සාමාජිකයන් වන්නේය. සෑම ආසන බල මණ්ඩලයක්ම මධ්‍යම කාරක සභාව විසින් සකස් කර දෙනු ලබන රීතිමාලාවක් භාවිතා කළ යුතුය.

13.00 <u>දිස්ත්‍රික් කමිටු.</u>
සෑම දිස්ත්‍රික්කයකටම දිස්ත්‍රික් කමිටුවක් පිහිටුවිය හැක්කේය. දිස්ත්‍රික් ප්‍රධාන හා නියෝජ්‍ය සංවිධායකවරුන් හා ආසන සංවිධායකවරුන් පමණක් දිස්ත්‍රික් කමිටු සාමාජිකයන් වන්නේය. දිස්ත්‍රික් කමිටු මධ්‍යම කාරක සභාව විසින් සකස් කරන ලද රීති මාලාවක් භාවිතා කළ යුත්තේය.

14.00 <u>සමස්ත දිස්ත්‍රික් කාරක සභාව</u>
පක්ෂයට දිස්ත්‍රික් සංවිධායකවරුන්ගෙන් සමන්විත සමස්ත දිස්ත්‍රික් කාරක සභාවක් වන්නේය. එම සභිකයන් විවිධ තනතුරු හොබවමින් පක්ෂයේ ප්‍රගතිය සඳහා කටයුතු කළ යුතු වන්නේය. එම සභිකයන්ගේ ක්‍රියාකාරී ප්‍රගතිය සහ මධ්‍යම කාරක සභාවේ තීරණය අනුව ඔවුන් මධ්‍යම කාරක සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබන්නේය. සමස්ත දිස්ත්‍රික් කාරක සභාව මධ්‍යම කාරක සභාව විසින් සකස් කරන ලද රීති මාලාවක් භාවිතා කළ යුත්තේය.

15.00 <u>උපදේශක සභාව</u>
පක්ෂයට උපදේශක සභාවක් වන්නේය. පක්ෂය විසින් හඳුනාගත් විවිධ ක්ෂේත්‍රවල පුද්ගලයන්ට උපදේශක සභාවේ සාමාජිකත්වය පිරිනමන්නේය. උපදේශක සභාවේ සාමාජිකයන් පක්ෂයට අය කිරීමකින් තොරවම උපදෙස් සැපයිය යුතු වන්නේය. මධ්‍යම කාරක සභාව විසින් සකස් කරන ලද රීති මාලාවක් උපදේශක සභාව විසින් භාවිතා කළ යුත්තේය.

16.00 <u>අනුශාසක සභාව</u>
පක්ෂයට අනුශාසක සභාවක් වන්නේය. පක්ෂය විසින් හඳුනාගත් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් අනුශාසක සභාව සමන්විත වන්නේය.

17.00 <u>මුදල් හා දේපල</u>

17.01 පක්ෂයට තම නමින් චංචල හා නිශ්චල දේපල තබා ගැනීම හා බැහැර කිරීම කළ හැකිය.

17.02 පක්ෂයට බැංකු ගිණුමක්, ගිණුම් හෝ අරමුදලක් පවත්වාගෙන යා හැක්කේය.

17.03 සාමාජික මුදල්, පරිත්‍යාග, ආධාර, ඉපයීම් හා වෙනත් ලැබීම්වලින් මෙම ගිණුම් හෝ අරමුදල සමන්විත වේ.

17.04 පක්ෂයේ චංචල හා නිශ්චල දේපල සහ බැංකු ගිණුම් හෝ චෙක්පත් සම්බන්ධව කටයුතු කිරීම භාණ්ඩාගාරිකගේ වගකීම වන්නේය.

13.05 පක්ෂයේ මූල්‍ය වාර්තාව විගණනය කිරීම සඳහා පිළිගත් විගණකාධිවරයෙකුගේ සහය ලබාගත හැක්කේය.

18.00 <u>පක්ෂයේ ජාතික සම්මේලනය</u>

18.01 පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් සුදුසු යයි තිරණය කරන දිනයකදී හා ස්ථානයකදී පක්ෂයේ ජාතික සම්මේලනය වසර 3 කට වරක් පැවැත්විය හැක්කේය. ජාතික සම්මේලනයට අමතරව අවශ්‍යවූ විටෙක විශේෂ සම්මේලන කැඳවීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය.

18.02 පක්ෂයේ ජාතික සම්මේලනයක් නියමිත කාලයේ දී පැවැත්වීමට නොහැකි වුවහොත්, අදාල කාලයට නියමිත ජාතික සම්මේලනය පැවැත්වෙනතුරු මධ්‍යම කාරක සභාවේ නිළධාරීන් දිගටම එම ධුර දරන්නේය. මධ්‍යම කාරක සභා රැස්වීම් පවත්වා තීන්දු ගත හැකි අතර පක්ෂයේ සෙසු කටයුතු පෙර පරිදිම කරගෙන යා හැක්කේය.

18.03 පක්ෂයේ ජාතික සම්මේලනයට සහභාගි විය හැක්කේ මධ්‍යම කාරක සභිකයන්ට, දිස්ත්‍රික් ප්‍රධාන හා නියෝජ්‍ය සංවිධායකවරුන්ට සහ ආසන සංවිධායකවරුන්ට පමණි. ජාතික සම්මේලනයට සහභාගිවීමට හිමිකම් ඇති සාමාජිකයන් අඩකට වැඩියෙන් සහභාගි වන්නේ නම් පමණක් ජාතික සම්මේලනයේ තිරණ ව්‍යවස්ථානුකූල වන්නේය. ජාතික සම්මේලනයේ දී ඉදිරිපත් කෙරෙන සියළු යෝජනා එදින සහභාගි වී ඇති ඡන්දය භාවිතා කිරීමට හිමිකම් ඇති සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් සම්මත විය යුත්තේය. පක්ෂය විසින් ආරාධනය කරන ආරාධිත අමුත්තන්ට ඡන්ද බලය හිමි නොවන්නේය.

18.04 ජාතික සම්මේලනයේදී මධ්‍යම කාරක සභාවේ නව නිළධාරී මණ්ඩලය පත්කර ගත හැක්කේය. එලෙස නිළධාරීන් තෝරා පත් කරගත යුතු පදනම ද, ආකාරය ද මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුත්තේය. ජාතික සම්මේලනයේදී ව්‍යවස්ථා සංශෝධන හා අනෙකුත් යෝජනා සම්මත කරවා ගත හැක්කේය. එවැනි යෝජනා පක්ෂයේ මහ ලේකම් වෙත ජාතික සම්මේලනය පැවැත්වීමට නියම කරගත් දිනයට සති දෙකකට කලින් ලැබීමට සැලැස්විය යුත්තේය.

18.05 ජාතික සම්මේලනයෙක් පැවැත්විය යුතුයයි යෝජනා කිරීම, ජාතික සම්මේලනයේ දී සියළු වැඩ කටයුතු සංවිධානය කිරීම, නව නිළධාරී මණ්ඩලය නම් කිරීම, පැවැත්වෙන දිනය හා ස්ථානය නියම කිරීම හා එවැනි යෝජනා ඉදිරිපත් කිරීමේ අභිමතය මධ්‍යම කාරක සභාව සතුය. එවැනි යෝජනා පුරෝගාමීන්ගේ හා ජ්‍යෙෂ්ඨයන්ගේ ඡන්දය ඇතුළු මධ්‍යම කාරක සභාවේ 2/3 ක ඡන්දයෙන් සම්මත විය යුත්තේය.

19.00 <u>ව්‍යවස්ථා සංශෝධන</u>

පක්ෂය විසින් 2021.03.13 වෙනි දින පවත්වන ප්‍රථම ජාතික සම්මේලනයේදී සම්මත කළ පක්ෂයේ මෙම ව්‍යවස්ථාව මින් ඉදිරියට ක්‍රියාත්මක වන්නේය.

19.01 මධ්‍යම කාරක සභාව විසින් පක්ෂයේ නාමය හෝ ලාංඡනය සංශෝධනය කළ අවස්ථාවක, එම සංශෝධනවලට මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය හිමිවූ පසු, එම සංශෝධන පක්ෂයේ ව්‍යවස්ථාවට ඇතුලත් කළ හැකිය.

19.02 මධ්‍යම කාරක සභාව විසින් මෙම ව්‍යවස්ථාව, අන්‍ය භාෂාවකට පරිවර්තනය කොට ඇත්නම්, එම පරිවර්තනයත්, මෙම සිංහල පිටපතත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් මෙම සිංහල පිටපත බලපැවැත්වේ.

13.03.2021

ජයන්ත ලියනගේ
මහ ලේකම්
සිංහලද්වීප ජාතික පෙරමුණ
සම්බන්ධීකරණ කාර්යාලය
14/5A, ධර්මපාල මාවත, සොල්අත්තාපිටිය,
කුරුණෑගල.



## පළමුවන උපලේඛණය
පක්ෂයේ මැතිවරණ ලාංඡනය

